# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## ලේඛකාධිකාරී තනතුර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2020.09.28 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ උපාධියක් සහිත පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් සමග පළමු උපාධිය ලද දින සිට වසර දහයකට (10) නොඅඩු පරිපාලන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ උපාධියක් සහිත පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ වසර දෙකකට (02) නොඅඩු පශ්චාද් උපාධියක් සමග පළමු උපාධිය ලද දින සිට වසර දොළහකට (12) නොඅඩු පරිපාලන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් හා පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ වසර එකකට (01) නොඅඩු පශ්චාද් උපාධියක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක වසර තුනක (03) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පළමු උපාධිය ලද දින සිට වසර දහහතරකට (14) නොඅඩු පරිපාලන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම. එමෙන්ම එම වසර දහහතරක (14) කාල සීමාවෙන් අවම වශයෙන් වසර පහක (05) සේවා කාලයක් නියෝජ්‍ය ලේකම්/නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ/හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී {(U-EX 2 (II)) වැටුප් තලයේ} විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනයක සේවය කර තිබීම.

හෝ

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් හා පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ වසර එකකට (01) නොඅඩු පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම් /නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක වසර තුනක (03) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පළමු උපාධිය ලද දින සිට වසර පහළොවකට (15) නොඅඩු පරිපාලන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම. එමෙන්ම එම වසර පහළොවක (15) සේවා කාලයෙන් අවම වශයෙන් වසර පහක (05) සේවා කාලයක් නියෝජ්‍ය ලේකම්/නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ/හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී {(U-EX 2 (II)) වැටුප් තලයේ} විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කර තිබීම.

හෝ

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සහිතව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දී ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක වසර තුනක (03) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු වසර පහළොවක (15) පරිපාලන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම. එමෙන්ම එම වසර පහළොවක (15) සේවා කාලයෙන් අවම වශයෙන් වසර පහක (05) නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක සහ/හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී {(U-EX 2 (II)) වැටුප් තලයේ} විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කර තිබීම.

හෝ

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක් නොවන පරිපාලන ක්ෂේත්‍රයේ වසර දහඅටක (18) සේවා පළපුරුද්දක් තිබීම. එම වසර දහ අටක (18) සේවා කාලයෙන් අවම වශයෙන් වසර තුනක (03) කාලයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී සේවයක් සහිත විය යුතු අතර, එම තනතුරේ සේවය කර තිබිය යුතුය.

**සටහන :**

"පරිපාලන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද" යන්නෙන් අදහස් කරනුයේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ඊට සමාන තනතුරක රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ මානව සම්පත් කළමනාකරණයේ හෝ සාමාන්‍ය පරිපාලනයේ හෝ සමස්ත කළමනාකරණයේ, සේවා පළපුරුද්දයි. මේ සඳහා මූල්‍ය/ ඉංජිනේරු හෝ වෙනත් තාක්ෂණික ක්ෂේත්‍ර වැනි විශේෂිත ක්ෂේත්‍රවල අත්දැකීම් සලකා බලනු නොලැබේ.

**වයස :**

අවුරුදු 45 ට නොඅඩු විය යුතුයි (රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල / උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු සේවකයින්ට වයස් සීමාව අදාළ නොවේ)

**වැටුප් පරිමාණය :**

U-EX3 (I) - රු. 104,000 - 3 X 2,170, 11 X 2,700 - 140,210/- ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ද ගෙවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ:**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රෙගුලාසිවලට අනුකූලව ස්ථිර පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානය දක්වා ප්‍රවාහන පහසුකම් හිමිවීම.

(ආ) වසර හතක (07) සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු සම්පූර්ණ වැටුප් සහිතව වසරක (01) කාලයක් සඳහා සජ්ජ වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලැබේ. සජ්ජ වාර්ෂික නිවාඩු සඳහා විදේශගත වන නිලධාරියෙකුට තමාට / තමාට සහ ඔහුගේ සහකරුට හෝ සහකාරියට ගමන් බලපත්‍ර හිමිවීම.

(ඇ) 1983 අංක 12 පාරිතෝෂික පනතේ විධිවිධානවලට අනුකූලව පාරිතෝෂික ගෙවීම් හිමිවීම.

(ඈ) සේවකයා විසින් 10% ක් සහ සේවායෝජකයා විසින් 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ලබාදීම.

(ඉ) සේවායෝජකයා විසින් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට 8% ක දායකත්වයක් ලබා දීම.

(ඊ) සේවායෝජකයා විසින් 3% දායකත්වයක් සේවක භාරකාර අරමුදලට ලබා දීම.

මීට අදාළව අයදුම්පත සහ අනෙකුත් තොරතුරු විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.sjp.ac.lk වෙතින් බාගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර **"උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට **2020.09.28 දිනට පෙර** ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් භාරදීම සිදුකළ යුතුය.

අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ. අවශ්‍යතා සපුරා නොකරන අයදුම්පත්, අදාළ ආකෘතියේ නොමැති අයදුම්පත් (වෙබ් අඩවියෙන් බාගත කර නොමැති) සහ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**උපකුලපති,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**